මිනිපේ ප්‍රාදේශීය සභාව - 2023

-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මිනිපේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මිනිපේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ දී, හසළක මහජන පුස්තකාලය අළුත්වැඩියා කිරීම හා හසළක ගුරුළුපොත ජල ටැංකියට ආවරණයක් යෙදීම වෙනුවෙන් රු.115,542 ක් අඩුවෙන් ද හසළක ගුරුළුපොත ජල ටැංකියට ජල පෙරණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය නිම කර නොතිබිය දී, රු.4,607,472 ක් ප්‍රාග්ධනිත කර තිබීම හේතුවෙන්, එම මුදල වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කර ගන්නා බව | ගොඩනැගිලි නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | ඉකුත් වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.23,800 ක UPS බැටරි 05 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර, දිවා සුරැකුම් මධ්‍යස්ථානයට මිල දී ගෙන තිබුණු රු.218,350 ක ලී බඩු හා උපකරණ ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි. | - එම - | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඇ) | ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ දී හඳුනාගත් රු.615,750 ක මුද්දර ගාස්තු ආදායමක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. | - එම - | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඈ) | පොදු තැන්පතු ගිණුමේ සඳහන් අවස්ථා 23 කට අදාළ එකතුව රු.247,289 ක් ආදායමට ගැනීමේ දී පොදු තැන්පතු ගිණුම හර කර තිබුණ ද, බැර සටහන් තබා නොතිබුණි. මේ හේතුවෙන් ගිණුම් තුලනය වූ ආකාරය පැහැදිලි නොවුණි. | මේ සම්බන්ධයෙන් සොයා බලා නිවැරදි කර ගන්නා බව | නිවැරදිව ද්විත්ව සටහන් තැබිය යුතුය |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ස්ථාවර තැන්පතු 02 කින් ලැබිය යුතු රු.214,189 ක පොලී ගිණුම්ගත කර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කර ගන්නා බව | ලැබිය යුතු පොලී නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළ දී, නොගෙවූ වැටුප් හා වේතන සහ වියදම් ණයහිමියෝ ඌන වෙන් කිරීම රු.106,248 ක් ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | ණයහිමියෝ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (උ) | සභාව විසින් තොග ගිණුම්ගත කිරීමේ දී, වර්ෂයේ මිලදී ගැනීම් වියදම් ගිණුම හර කර, මුදල් පොත බැර කර පසුව | 2024 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කර ගන්නා බව | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

| | | |
|---|---|---|
| එම මුළු වියදම් තොග හර කර, වියදම් ගිණුම් බැර කිරීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණ ද, එහි දී රු.1,602,198 ක ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් දෙවරක් වියදම් ගිණුමට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. මේ හේතුවෙන් ගිණුම තුලනය වූ ආකාරය පැහැදිලි නොවුණි. | | |
| (ඍ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට සේවක ණය ශේෂය ඉදිරියට ගෙන ඒමේ දී, හඳුනාගත් වෙනස රු.192,664 ක් අවිනිශ්චිත ගිණුමට හර කළ යුතු වුවත්, සමුච්චිත අරමුදලට හර කර වෙනස කපා හැර තිබුණි. | - එම - | - එම - |

1.6.2 **අවිනිශ්චිත ගිණුම්**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ රු.367,300 ක් ව පැවැති අවිනිශ්චිත ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.1,318,262 ක් දක්වා වැඩි වී තිබුණු අතර, මේ පිළිබඳව සොයා බලා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකර නිරවුල් කර නොතිබුණි. | ගිණුම සැකසීමේ දී සිදු වී ඇති දෝෂයන් 2024 වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කර ගන්නා බව | අඩුපාඩු හඳුනා ගෙන අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය |

1.6.3 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.937,286 ක වත්කම් විෂයන් 05 කට හා රු.8,030,316 ක වගකීම් විෂයයකට අදාළව ලේඛන, ලිපිගොනු හා උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මේ සම්බන්ධයෙන් තවදුරටත් සොයා බලා වාර්තා කරන බව | ගිණුම් ශේෂ සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය උපලේඛන නිවැරදිව පවත්වා ගෙන යා යුතුය |

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදේර්ශය** |
|---|---|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත** | | | |
| (i) | 24 වගන්තිය | සභාවේ මාර්ග ඉන්වෙන්ට්‍රියේ සඳහන් මාර්ග 212 ක් ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට යම් ප්‍රමාණයක් මාර්ග මැනුම් කටයුතු අවසන් කොට මාර්ග ගැසට් කිරීමේ කටයුතු සිදු කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 127 වගන්තිය | සභාව විසින් පොදු කටයුතු සඳහා භාවිතා කරනු ලබන ඉඩම් කොටස් 99 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් කොමසාරිස් සතු ඉඩම්වලින් කොටසක් සඳහා මැනුම් ගාස්තු ගෙවා මැනුම් කටයුතු සිදු කර ඇති අතර, ගැටළු සහිත ඉඩම් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කරන බව | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | 2023 මාර්තු 17 දිනැති අංක 3/4/10 පොදු දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ 05.6 වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත සභාවේ වාහන භාවිතා කිරීමේ දී, දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත යුතු වුව ද, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අවස්ථා 20 කදී වාහනය භාවිතා කර ඉන්ධන ලීටර් 519 කට රු.163,434 ක් මුදල් වැය කර තිබුණි. | ප්‍රාදේශීය සභාවේ කටයුතු සඳහා පමණක්ම සහභාගී වී ඇති බවත්, අදාළ රාජකාරියට අමතරව සහකාර පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, ඇතුළු ආයතනික රාජකාරී කටයුතු සඳහා යොදා ගත් බව | විධිමත් අනුමැතියක් ලබාගෙන වාහන භාවිතා කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,502,728 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,284,008 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,335,885 | 1,389,485 | 1,293,683 | 2,937,444 | 1,335,885 | 1,333,672 | 848,500 | 2,841,642 |
| (ii) | කුලී | 4,681,391 | 5,498,461 | 4,178,375 | 16,018,132 | 7,592,442 | 5,627,771 | 4,187,388 | 14,698,046 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,262,500 | 2,070,175 | 2,118,400 | 208,650 | 1,717,000 | 1,360,008 | 1,279,477 | 256,845 |
| (iv) | වෙනත් ආදායම් | 7,499,219 | 18,869,569 | 19,583,448 | 14,904,470 | 12,609,000 | 16,147,595 | 10,114,377 | 15,618,349 |
| | එකතුව | 14,778,995 | 27,827,690 | 27,173,906 | 34,068,696 | 23,254,327 | 24,469,046 | 16,429,742 | 33,414,882 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | වරිපනම් ඒකකයක හිඟය රු.10,000 ඉක්ම වූ දේපළ 35 කින් අය විය යුතු රු.747,164 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තවදුරටත් අය විය යුතු මුදල් අය කර ගැනීම සඳහා ජංගම සේවා වැඩසටහන් පවත්වන බව | හිඟ වරිපනම් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන 15 ක වරිපනම් ඒකක 68 කින් රු.251,680 ක මුදලක් අය කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා අදාළ ආයතන දැනුවත් කර ඇති බව | හිඟ ආදායම් අය කර ගත යුතුය |
| (ආ) | **කුලී** | | |
| | සභාවට අයත් පොදු වෙළඳ පොළ 05 ක කඩ කාමර 29 කින් හා ජංගම වෙළඳ කුටි 02 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,234,477 ක මුදලක් අය කර ගෙන නොතිබුණි. ඉන් වසර 01 ත් 05 ත් අතර කාලයක සිට අය නොකළ ශේෂය රු.1,553,560 ක් ද වසර 05 ට වඩා වැඩි කාලයක සිට අය විය යුතුව තිබුණු ශේෂය රු.1,104,599 ක් ද විය. | ගිවිසුම් අත්සන් කිරීම සඳහා බදුකරුවන් වෙත දිගින් දිගටම ලිපි මඟින් කැඳවීම් කරනු ලැබුව ද ,ඔවුන් නොපැමිණි බැවින්, ගිවිසුම්ගත වීමට හැකි වූ අතර, එම කඩකාමර සහිත ඉඩම් සභාවට පවරා දිම ප්‍රමාදවිම හේතුවෙන් නෛතික ක්‍රියා මාර්ග ගැනිමට ද නොහැකි වි ඇති බව | හිඟ කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | **ජල ආදායම්** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,834,512 ක හිඟ ජල ගාස්තුවක් පැවති අතර, ඉන් වසර 01 ත් 05 ත් අතර කාලයක සිට අය නොවී පවතින ශේෂය රු.1,513,355 ක් ද, වසර 05 ට වඩා වැඩි කාලයක සිට අය නොවී පවතින ශේෂය රු.1,814,520 ක් පැවතිය ද, අය කර නොතිබුණි. | විශේෂ ජංගම සේවා පවත්වමින් හිඟ ජල ගාස්තු අය කර ගැනිම සිදු කරන බව | හිඟ ආදායම් අය කර ගත යුතුය |
| (ඈ) | **දැන්වීම් පුවරු ආදායම** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දැන්වීම් පුවරු 28 කින් රු.208,650 ක මුදලක් අය කර නොතිබුණි. | දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදු කර ඇති අතර, දෙවන සිහි කැඳවීම් ලිපි ද යවා ඇති බව | හිඟ දැන්වීම් පුවරු ආදායම අය කර ගත යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 79 සිට 84 දක්වා වගන්තිවල විධිවිධානයන් අනුව, සමාලෝචිත වර්ෂය තුළ දී සභාව විසින් ජලාපවාහන සම්බන්ධ කිසිදු සංවර්ධන කටයුත්තක් ඉටු කර නොතිබුණි. | ඉදිරි සංවර්ධන යෝජනා හා මහජනතාවගෙන් ලැබෙන යෝජනාත් සමඟ සමීක්ෂණයක් සිදු කර ප්‍රමුඛතාවය මත නව ඉදිකිරීම් සිදු කරන බව | බල ප්‍රදේශයේ ජනතාවගේ පොදු සුභ සාධනය වෙනුවෙන් පනතේ කාර්යයන් ඉටු කළ යුතුය |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 සිට 95 දක්වා වගන්තිවලට අනුව, මළ ප්‍රවාහනය සහ කසළ ශෝධනය ප්‍රාදේශීය සභාව විසින් ඉටු කළ යුතු වුවත්, ගලි රථයක් සපයා ගැනීමට හා මළ පිරිපහදු ඒකකයක් ආරම්භ කිරීමට සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | ගලි රථයක් ලබා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත ඉල්ලීමක් කිරීමටත්, මළ පිරිපහදු ඒකයක් තිත්තවැල්ල කසළ අංගනයේ ආරම්භ කිරීමටත් සැලැසුම් කරන බව | පොදු මහජන සෞඛ්‍ය වෙනුවෙන් ඉටු විය යුතු කාර්යයන් ඉටු කළ යුතුය |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 27 වගන්තිය යටතේ සභා බල ප්‍රදේශයට අයත් මංමාවත් වැඩි දියුණු කිරීම හා අලුත් මංමාවත් ඉදිකිරීම සභාව සතු කාර්යයක් වුවත්, සමාලෝචිත වර්ෂය තුළ දී මංමාවත් ඉදිකිරීම හා වැඩි දියුණු කිරීම සඳහා සභා අරමුදලින් කිසිදු මුදලක් වැය කර නොතිබුණි. | ප්‍රමුඛතා හඳුනා ගෙන කටයුතු කරන අතර, සභාව සතුව ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින්, ශ්‍රමදාන මඟින් මංමාවත් ඉදිකරන බව | පොදු උපයෝගීතා සේවා වැඩි දියුණු කළ යුතුය |
| (ඈ) | ප්‍රාදේශීය සභාව විසින් පවත්වා ගෙන යන ජල ව්‍යාපෘති 11 ක ජල සාම්පල් පරීක්ෂාවක් සිදු කර නොතිබුණු අතර, පාරිභෝගිකයින්ට බෙදා හරින ජලයේ තත්ත්වය හඳුනා ගෙන නොතිබුණි. එමඟින් ප්‍රාදේශීය ජනතාවගේ සෞඛ්‍ය පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | පිරිපහදු කළ පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතියක් ප්‍රාදේශීය සභාවේ නව ආදායම් ප්‍රභවයක් ලෙස ආරම්භ කිරීමට සැලැසුම් කොට අනුමැතිය සඳහා යොමු කොට ඇති බව | ජලයේ තත්ත්වය පරීක්ෂා කර ගුණත්වයෙන් යුතු ජලය ලබා දීමට කටයුතු කළ යුතුය |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| 1997 වර්ෂයේ සභාව සතු ඉඩමක අනවසරයෙන් ඉදිකළ අත්තිවාරමක් එවකට සිටි සභාපතිවරයා විසින් කඩා ඉවත් කිරීම හේතුවෙන්, රු.500,000 ක අලාභයක් ඉල්ලා නඩු පවරා තිබුණු අතර, සභාව වෙනුවෙන් කිසිවෙකු පෙනී නොසිටීම නිසා, රු.500,000 ක් වන්දි මුදල් හා නඩු ගාස්තු වශයෙන් රු.30,500 ක් ලෙස එකතුව රු.530,500 ක මුදලක් ගෙවන ලෙස ඒක පාර්ශවික අධිකරණ තීරණයක් | මේවන විට නඩු කටයුතු සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව | වගකිව යුතු පුද්ගලයින්ගෙන් අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

ලබා දී තිබුණි. මෙම රු.530,500 ක අලාභය සඳහා මු.රෙ.104(04) පරීක්ෂණයෙන් පුද්ගලයින් 04 දෙනෙකුගෙන් රු.134,950 ක් බැගින් අය කිරීමට තීරණය කර ඇතත්, අය කර නොතිබුණි.

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු වත්කම් 09 ක් බදු දීමෙන් රු.1,280,711 ක බදු මුදලක් අය කර නොතිබුණි. මින් වසර 01 සිට 05 අතර කාලයක සිට අය කර නොතිබුණු ශේෂය රු.1,177,211 ක් ද, වසර 05 කට වඩා වැඩි කාලයක සිට අය කර නොතිබුණු ශේෂය රු.103,500 ක් ද විය. | මෙම හිඟ අය කර ගැනීම සම්බන්ධයෙන් මේ වන විට කටයුතු සිදු කරමින් පවතින බව | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | හසළක වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 20 කින් රු.11,255,232 ක බදු මුදලක් අය විය යුතු වුවද, බදුකරුවන් මෙම මුදල් ගෙවීම පැහැර හැර තිබුණු අතර, මෙම කඩ කාමරවල ලිපිගොනු පරීක්ෂාවේ දී, සභාව හා බදුකරුවන් අතර 2009 වර්ෂයෙන් පසු ගිවිසුම්ගත වීමට කටයුතු කර නොතිබුණි. සියලුම කඩ කාමරවල බදු ගිවිසුම අනුව, අඩි 13 X 29 ප්‍රමාණයේ වුව ද, මෙම කඩ කාමර අඩි 13 X 60 ප්‍රමාණයේ දිගින් යුතුව ඉදිකිරීම් සිදු කර තිබුණු අතර, කඩ කාමරවල බදුකරුවන් කඩ කාමරය පිටුපස ස්ථිරව පදිංචි වී සිටින බව ද, මෙම වෙළඳ සංකීර්ණයේ ඉහළ මහලේ ගොඩනැගිලි ඉදිකිරීම සභාව සිදු කළ යුතු වුවත්, බදුකරුවන් අනවසරයෙන් ඉහළ මහළ ඉදිකර තිබුණු අවස්ථා ද, මෙහි දී එකවර අය කළ යුතු මුදල් අය කර ගෙන ද නොතිබුණි. | සභාව විසින් ලිඛිතව මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම් කර ඇතත්, බදුකරුවන් විසින් කිසිදු අනුකූලතාවයක් දක්වා නැති බව | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමටත් සියලු බදු මුදල් කාලීනව අය කර ගත යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැති ශේෂය රු.2,458,970 ක් වූ අතර, ඉන් වසර 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබුණු ශේෂය රු.39,083 ක් ද, වසර 05 ක් ඉක්ම වූ ශේෂය රු.746,961 ක් අය කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් සොයා බලා නිවැරදි තොරතුරු ඉදිරිපත් කරන බව | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවැති කර්මාන්ත ණයහිමි ශේෂයේ එකතුව රු.854,044 ක් වූ අතර, ඉන් වසර 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබුණු ශේෂවල එකතුව රු.74,083 ක් ද, වසර 05 ක් ඉක්ම වූ ශේෂය රු.779,961 ක් ද නිරවුල් කර නොතිබුණි. | 2012 හා 2013 වර්ෂයන් හී කර්මාන්ත ඵලදායී ලෙස නිම නොකිරීම හේතුවෙන්, අවසාන කොටස් මුදල් ගෙවා නොමැති බව | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය |
| (ඉ) | සභාව විසින් වාර්ෂිකව බද්දට ලබා දුන් සති පොළවල් 05 කින් රු.451,027 ක මුදලක් 2020 වර්ෂයේ සිට අය කිරීමට හෝ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා අදාළ පාර්ශව වෙත ලිඛිතව දැනුම් දී ඇති අතර, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සභාවේ සමස්ත ජල පාරිභෝගික සංඛ්‍යාව 1,864 ක් වන අතර, ඉන් ජල පාරිභෝගිකයින් 271 කුගේ ජල මීටර් අක්‍රියව පැවතුණ ද, මෙම ජල මනු ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. අක්‍රිය ජල මීටර් පවතින ගෘහස්ථ පාරිභෝගිකයින්ගෙන් රු.250 ක් හා ව්‍යාපාරික පාරිභෝගිකයින්ගෙන් රු.500 ක් වශයෙන් ගාස්තු අය කිරීම හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායම අහිමි වී තිබුණි. | අක්‍රිය ජල මීටර් පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ඇති අතර ඒ අනුව ජල මීටර් සවි කිරීම සිදු කරමින් පවතින බව | ජල මීටර් සවි කර ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය |

3.4 **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.1,978,050 ක වාහන 03 ක් වසර 08 ක පමණ කාලයක සිට ධාවන තත්ත්වයේ නොපවතින අතර, මෙම වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | කැබ් රථය හා ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීමට කටයුතු කරන අතර, ට්‍රේලරය වෙන්දේසි කිරීමට කටයුතු කරන බව | අදාළ ක්‍රියාමාර්ග කඩිනමින් අවසන් කළ යුතුය |
| (ආ) | 2020 වර්ෂයේ දී ත්‍රීරෝද රථ නැවතුම් පොළවල් සඳහා සකස් කරන ලද රු.297,500 ක් වටිනා නාම පුවරු 17 ක් සවි කිරීමෙන් තොරව ගබඩාවේ රඳවා ගෙන තිබුණි. | හසළක පොලිසිය සමඟ සම්බන්ධ වී ත්‍රී රෝද රථ නැවතුම් පොළ ක්‍රමානුකූලව ස්ථානගත කොට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කරන බව | ත්‍රී රෝද රථ නැවතුම් ස්ථාන විධිමත් කර ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | රු.71,949,560 ක් වැය කර පුර නැඟුම ව්‍යාපෘතිය යටතේ ඉදිකළ බහු කාර්යය ගොඩනැගිල්ලේ දෙවන මහලේ වර්ග අඩි 7,000 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | නාගරික සංවර්ධන අධිකාරිය හා පෞද්ගලික අංශයේ සහාය ලබා ගෙන මෙහි ඵලදායී ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර ඇති බව | ඵලදායී කාර්යයක් සඳහා යොදා ගත යුතුය |

3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට 2000 ඔක්තෝබර් 20 දිනැති අංක 4/3/9672 දරන පැවරුම් නියෝගයෙන් පවරා ඇති හසළක සති පොළ ඉඩමෙහි අනවසර පදිංචිකරුවෙකු පර්චස් 07 ක පමණ ඉඩම් කොටසක් අල්ලා ගෙන ඇතත්, අනවසරකරු ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අනවසර පදිංචිකරු ඉවත් කිරීම සම්බන්ධයෙන් මේ වන විට පළාත් පාලන කොමසාරිස් මඟින් නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බව | අනවසර අත්පත් කර ගැනීම් ඉවත් කළ යුතුය |

## 3.6 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| වේරගංතොට පානීය ජල යෝජනා ක්‍රමය ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ දී, රු.286,155 ක මුදලක් වැය කර ඇතත්, නිසි ප්‍රමිතියකින් තොරව ඉදිකිරීම් සිදු කර ඇති බැවින්, ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. | ජල ව්‍යාපෘතිය ප්‍රමිතියෙන් තොරව ඉදිකිරීම හේතුවෙන් අත හැර දමා ඇති බව | සැලැසුම් කළ කාර්යයන් නියමිත පරිදි ඉටු කළ යුතුය |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේ දී තනතුරු 08 ක පුරප්පාඩු 12 ක් ද, එක් තනතුරක අතිරික්තතා 02 ක් ද විය. | නව බඳවා ගැනීම් සිදු නොකරන බැවින්, පුරප්පාඩු පවතින බව | සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### තිරසාර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව, ප්‍රාදේශීය සභාව ඉටු කළ යුතු අරමුණු 04 ක් කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි අවධානය යොමු කර කටයුතු කළ යුතුය |